# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 අගෝස්තු / සැප්තැම්බර්

සමාජීය විද්‍යා පීඨය

දේශපාලන විද්‍යාව (නව / පැරණි නිර්දේශය)

## දේශපාලන චින්තනය **POLS – E 2025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

---

01. ප්ලේටෝ සිය දේශපාලන චින්තනය තුළ යුක්තිය පිළිබඳ අදහස ඉදිරිපත් කර ඇත්තේ කෙසේද? සාකච්ඡා කරන්න.

02. "ශාන්ත තෝමස් ඇක්වයිනාස්ගේ අදහස් මධ්‍යකාලීන යුගයේ දේශපාලන චින්තනයේ පරිවර්තනයන් පෙන්නුම් කරයි." අදහස් දක්වන්න.

03. දේශපාලන චින්තන ඉතිහාසය තුළ මැකියාවෙලි ගේ දායකත්වය ඔබ අගය කරන්නේ කෙසේද?

04. සිය සමාජ සම්මුති න්‍යාය තුළ ස්වාධිපති බලය තෝමස් හොබ්ස් විස්තර කරන්නේ කෙසේද?

05. ලිබරල්වාදය එහි මූලික ලක්ෂණ ඇසුරින් පරීක්ෂා කරන්න.

06. ඉතිහාසය පිළිබඳ භෞතිකවාදී අර්ථකථනය පිළිබඳ මාක්ස්වාදී සංකල්පය විග්‍රහ කරන්න.

07. "කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍ර කෘතිය රාජ්‍ය පාලනය පිළිබඳ ප්‍රායෝගික උපදෙස් මාලාවකි." පරීක්ෂා කරන්න.

08. හින්දු දේශපාලන චින්තනයේ රාජ්‍ය සම්භවය හා රාජ්‍ය පාලනය පිළිබඳව ඉදිරිපත් වී ඇති අදහස් පරීක්ෂා කරන්න.

09. මාඕ සේතුං සිය සමාජවාදී මතවාදයන් සමකාලීන චීන සන්දර්භය තුළින් ඉදිරිපත් කෙරුණි. සාකච්ඡා කරන්න.

********************************